ඉ සැ. යු. — 2013.03.28 දින පළ වූ අංක 1,804 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,805 - 2013 අප්‍රේල් මස 05 වැනි සිකුරාදා - 2013.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | 934 | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 944 |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 934 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* (i) ශ්‍රී ලංකා හිරා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2012 දෙසැම්බර් මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2012 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අප්‍රේල් මස 26 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# වෙනත් පත් කිරීම් ආදිය

## ඌව පළාත් සභාව

2001 අංක 01 දරන ඌව පළාත් මාර්ග ප්‍රවාහන සේවා අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තියේ 20 වැනි වගන්තියේ නියමයන්ට යටත්ව 07 (අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වසරක කාලසීමාවක් සඳහා පහත සඳහන් පත්වීම කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය හා ඉදිකිරීම් පිළිබඳ අමාත්‍යවරයා.

ශෂීන්ද්‍ර රාජපක්ෂ,<br>
ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය,<br>
අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන,<br>
ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන හා ග්‍රාමීය<br>
යටිතල පහසුකම් සංවර්ධනය හා ඉදිකිරීම් පිළිබඳ අමාත්‍ය,<br>
ඌව පළාත් සභාව.

2012 සැප්තැම්බර් මස 08 වැනි දින,<br>
බදුල්ලේ දී ය.

නියෝග

ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපති වශයෙන් පහත නම් සඳහන් අය පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. එම්. අත්තනායක මහතා,<br>
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය),<br>
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය,<br>
ඌව පළාත් සභාව, බදුල්ල.

04-270

# පළාත් සභා නිවේදන

### 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(1) යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තියේ II වැනි උපවගන්තියේ *(අ)* ඡේදය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II වැනි පරිච්ඡේදයේ 5(1) වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂයයභාර අමාත්‍ය වන අතුල සරත් කුමාර විජේසිංහ වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් සුසාන මලමිනී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසාන ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නීතිඥ අතුල සරත් කුමාර විජේසිංහ,<br>
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයයභාර අමාත්‍ය,<br>
වයඹ පළාත් සභාව.

2012 නොවැම්බර් මස 30 වැනි දින,<br>
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලය.

### 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර බටපොතඇල සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම

පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බටපොතඇල ගමෙහි අ.ග.පී. 390 - (54) අම්බලපිටියහේන නැමති ඉඩම් කැබලි අංක 54

*උපලේඛනය*

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | පන්නල |
| ග්‍රාම නිලධාරි වසම | - | බටපොතඇල |
| ගම | - | බටපොතඇල |
| ඉඩමේ නම | - | අම්බලපිටියහේන |

*මායිම් :*

| | | |
|---|---|---|
| *උතුරට* | - | අංක 15 බිම් කට්ටිය, |
| *නැගෙනහිරට* | - | අංක 49 බිම් කට්ටිය, |
| *දකුණට* | - | අංක 50, 51, 52, 53 බිම් කට්ටි, |
| *බටහිරට* | - | අංක 19 ඒ බිම් කට්ටිය. |

**1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර වැල්ලෑව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම**

පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැල්ලෑව ගමෙහි අ.ග.පී. 377 - (25සී) බෝගහකැලේ නමැති ඉඩමේ කැබලි අංක 25 - සී

*උපලේඛනය*

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | පන්නල |
| ග්‍රාම නිලධාරී වසම | - | වැල්ලව |
| ගම | - | වැල්ලෑව |
| ඉඩමේ නම | - | බෝගහකැලේ |

*මායිම් :*

| | | |
|---|---|---|
| *උතුරට* | - | අංක 25 බිම් කට්ටිය සහ 297962 දරන හිමිකම් පිඹුරේ ඉඩමේ, |
| *නැගෙනහිරට* | - | 292962, 292958, 292963 දරන පිඹුරුවල ඉඩම්, |
| *දකුණට* | - | 292963, 292964 පිඹුරුවල ඉඩම්, |
| *බටහිරට* | - | 292964 පිඹුරේ ඉඩම සහ අංක 25 බිම් කට්ටිය. |

**1946 අංක 57 දරන පොදු සුසාන හා පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර පහළ කටුගම්පෙල සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම**

පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහළ කටුගම්පල ගමෙහි අ.ග.පි. 394-(12) බැම්ම නමැති ඉඩමේ කැබලි අංක 12

*උපලේඛනය*

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | පන්නල |
| ග්‍රාම නිලධාරී වසම | - | හමනාගොඩ |
| ගම | - | කටුගම්පල |
| ඉඩමේ නම | - | බැම්ම |

*මායිම් :*

| | | |
|---|---|---|
| *උතුරට* | - | හමනාගොඩ ගම් මායිම, කැබලි අංක 2 ඕ, |
| *නැගෙනහිරට* | - | කැබලි අංක 2 වී, 2 ආර්, |
| *දකුණට* | - | කැබලි අංක 2 ආර්, හමනාගොඩ ගම්මායිම, |
| *බටහිරට* | - | හමනාගොඩ ගම් මායිම |

**1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර මතව සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම**

පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මතව ගමෙහි අ.ග.පී. 395 - (1) රත්මල්ගාව හේන නමැති ඉඩමේ කැබලි අංක 1

*උපලේඛනය*

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | පන්නල |
| ග්‍රාම නිලධාරි වසම | - | වත්තෙගෙදර |
| ගම | - | මතව |
| ඉඩමේ නම | - | රත්මල්ගාව හේන |

*මායිම් :*

| | | |
|---|---|---|
| *උතුරට* | - | ගල්ගොමුල්ල ගම් මායිම, |
| *නැගෙනහිරට* | - | ටී. පී. 292465, |
| *දකුණට* | - | ටී. පී. 292465 සහ ටී. පී. 292457, |
| *බටහිරට* | - | පාරක්. |

**1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකර හමන්ගල්ල සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම**

පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හමන්ගල්ල ගමෙහි අ.ග.පි. 388- (86) තිත්පොලහේන නමැති ඉඩමේ කැබලි අංක 86

*උපලේඛනය*

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | පන්නල |
| ග්‍රාම නිලධාරි වසම | - | හමන්ගල්ල |
| ගම | - | හමන්ගල්ල |
| ඉඩමේ නම | - | තිත්පොලහේන |

*මායිම් :*

| | | |
|---|---|---|
| *උතුරට* | - | අංක 84 බිම් කට්ටිය, |
| *නැගෙනහිරට* | - | අංක 78 සහ 27 බිම් කට්ටි, |
| *දකුණට* | - | අංක 27 ඒ සහ 88 බිම් කට්ටි මාවත සහ 87 බිම් කට්ටිය, |
| *බටහිරට* | - | අංක 87, 56, 76, 85 බිම් කට්ටි. |

**1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය ප්‍රකාර කැකිල්ලපිටිය සුසාන භූමිය ප්‍රකාශයට පත් කිරීම**

පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැකිල්ලපිටිය ගමෙහි අ.ග.පි. 352- (38) වවුල්කැලේ නමැති ඉඩමේ කැබලි අංක 54

*උපලේඛනය*

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | පන්නල |
| ග්‍රාම නිලධාරි වසම | - | කැකිල්ලපිටිය |
| ගම | - | කැකිල්ලපිටිය |
| ඉඩමේ නම | - | වවුල්කැලේ |

*මායිම් :*

| | | |
|---|---|---|
| *උතුරට* | - | - |
| *නැගෙනහිරට* | - | - |
| *දකුණට* | - | අංක 39 දරන බිම් කට්ටිය, |
| *බටහිරට* | - | අංක 37 දරන බිම් කට්ටිය. |

04-33

## රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීමට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 60 - මහගල්ගමුව, අංක 61 - උල්පතගම, අංක 62 - බුල්නෑව, අංක 63 - වලස්වැව යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම පිළිබඳ වූ නිවේදනයයි

1. පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2013 ජුලි මස 09 දින පෙ.ව. 9.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* දිස්ත්‍රික්කය : කුරුණෑගල
*(ආ)* උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : ගල්ගමුව
*(ඇ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය හෝ කොට්ඨාස : අංක 60 - මහගල්ගමුව
අංක 61 - උල්පතගම
අංක 62 - බුල්නෑව
අංක 63 - වලස්වැව

*(ඈ)* ඉඩම් පිහිටි ගම් : ඉහත වසම්වලට අදාළ ගම්
*(ඉ)* ඉඩමේ නම :————.
*(ඊ)* ඉඩමේ පිහිටීම : ගල්ගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ
*(උ)* අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : නේවාසික කටයුතු සඳහා හා කෘෂිකාර්මික කටයුතු සඳහා
*(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය : පදිංචිය සඳහා පර්. 20 ක් සහ කෘෂිකාර්මික කටයුතු සඳහා උපරිමය අක්. 02 බැගින්.

2. 2008/4 චක්‍රලේඛය අනුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබාගැනීම සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

ඉහත ආදායම් කාණ්ඩයට අයත්වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2013.06.20 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව" යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2013 ජුලි මස 09 වැනි දින පෙ.ව. 9.00 ට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට හෝ ඇයට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම ඉල්ලුම්කරුවෙකුම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයකු ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා වුව ද එම ඉඩම වෙනුවෙන් නියම කරනු ලැබූ මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මිලට හිලව් කරනු ලැබේ.

7. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත නම් සඳහන් නිලධාරින්ගෙන් ඔවුන් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබා ගත හැක.

(i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) - පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල
(ii) ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව.

ඉඩම් කොමසාරිස් (වයඹ).

2013 මාර්තු මස 18 වැනි දින.

ඉල්ලුම් පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත :-

රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීමට ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 60 - මහගල්ගමුව, අංක 61 - උල්පතගම, අංක 62 - බුල්නෑව, අංක 63 - වලස්වැව යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.
3. (i) ලිපිනය :————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :————.
   (අ) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.
4. ගෘහ මූලික අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :————.
7. උපන් දිනය :————.
8. විවාහක/අවිවාහක බව :————.
9. රැකියාව :————.
10. රැකියාව කරන ස්ථානය :————.
11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් හවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :————.
14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය : (තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග) :————.
15. නිවස පිහිටි ස්ථානය :————.
16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන පාසලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| (i)<br>(ii)<br>(iii)<br>(iv) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? එසේනම් පහත විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| (i)<br>(ii)<br>(iii) | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙළිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
ග්‍රාම නිලධාරීගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

අනු අත්සන් කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :————.

ලිපිනය :————.

**දිවුරුම් ප්‍රකාශය**

.......................................... දිස්ත්‍රික්කයේ.............................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ....................................... ග්‍රාම නිලධාරි වසමේ.............................. පදිංචි............................................... වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ කලත්‍රයා ට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන් ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1793 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම ඉහත කී අක්කර .................... රූඩ් .......................... පර්. ........................... ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

..............................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

_________,
සාමදාන විනිශ්චයකාර තැන.

04-203

---

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ/කෘෂිකාර්මික හෝ නේවාසික කටයුතු සඳහා ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබූවන් සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනය**

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලබා දීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2013 ජුලි මස 29 දින පෙ.ව. 10.30 ට ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ) ඉඩම්වල නම් :* -

*(ආ) ඉඩමේ මැනුම් විස්තර :* - අයි. එස්. පී. පී. 23, අ.ග.පි. 2737, අ.ග.පි. 2739, අ.ග.පි. 1249, අ.ග.පි. 1256, අ.ග.පි. 1214, අ.ග.පි. 1242, අ.ග.පි. 1228, අ.ග.පි. 1241, අ.ග.පි. 1797, අ.ග.පි. 1213, අ.ග.පි. 1198, අ.ග.පි. 1244, අ.ග.පි. 1230, අ.ග.පි. 1286, අ.ග.පි. 2823, අ.ග.පි. 1262, අ.ග.පි. 2799, අ.ග.පි. 2793.

*(ඇ) ඉඩම පිහිටි ගම් :*- කිඹුල්වානාඔය ව්‍යාපාරය, ඕමාරගොල්ල, දියතුරේ, රාගෙදර, පුස්සැල්ලේගම, ගනේගොඩ, කදුලව, නැකැත්ත, දරම්ටිපොල, කහටවෙල, කිරිබමුණ, උඩවෙල, ලේනව, ඉහළ ගොකරැල්ල, පේද්දව, නීරම්මුල්ල, තම්මිට, දිග්ගලවත්ත, පොල්කටුව.

*(ඈ) ග්‍රාම නිලධාරි කොට්ඨාශය :*- 424 - වෙල්ගාල, 415 - ඕමාරගොල්ල, 412 - දියතුරේ, 506 - රාගෙදර, 503 - පුස්සැල්ලේගම, 436 - ගනේගොඩ, 479 - කදුලව, 498 - කහටවෙල, 482 - දරම්ටිපොල, 495 - නැකැත්ත, 480 - කිරිබමුණ, 518 - උඩවෙල, 494 - ලේනව, 487 - ඉහළ ගොකරැල්ල, 475 - පේද්දව, 421 - නීරම්මුල්ල, 438 - තම්මිට, 418 - දිග්ගලවත්ත, 420 - පොල්කටුව.

*(ඉ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :*- ඉබ්බාගමුව
*(ඊ) දිස්ත්‍රික්කය :*- කුරුණෑගල
*(උ) අන්සතු කිරීමට ඇති ඉඩම්වල ස්වභාවය :*- ගොඩ හා මඩ
*(ඌ) අන්සතු කරනු ලබන ඒකකය :*- නේවාසික : (උපරිම) පර්. 20, (අවම) පර්. 15,
වාණිජ : (උපරිම) පර්. 20, (අවම) පර්. 2 1/2,
කෘෂිකාර්මික : (උපරිම) අක්කර 01, (අවම) අක්කර 1/2.

2. ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි පහත දැක්වෙන පංතියට හෝ පංතිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

"ගොවි පංතියට අයත් නොවන"

ඉහත සඳහන් පංතියට හෝ පංතිවලට අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ලේඛන ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2013 ජුනි 27 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉබ්බාගමුව" වෙත ලැබිය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2013 ජුලි මස 29 වැනි දින පෙ.ව. 10.30 ට ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට හෝ ඇයට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති තැනැත්තන් පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයකු ලියවිල්ලක් මඟින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම දීර්ඝකාලීන බදු බලපත්‍රයන් සකස් කරන අතර ඒ සඳහා රජයේ තක්සේරුව මත තක්සේරු කරන මුදල ගෙවිය යුතු ය.

7. ඉඩම් කච්චේරියේ දී තෝරා ගන්නා පුද්ගලයින් සියලුම දෙනා 2008/4 චක්‍රලේඛ යටතේ ලියාපදිංචි වූ පුද්ගලයින් විය යුතු ය.

8. ඉහත සඳහන් ඉඩම් කච්චේරි පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබාගත හැකි ය :-

(i) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) - පළාත් ඉ.කො. කාර්යාලය, කුරුණෑගල
(ii) ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉබ්බාගමුව.

ජේ. එම්. ආර්. පී. ජයසිංහ,
පළාත් ඉඩම් කොමසාරිස්,
වයඹ පළාත.

2013 මාර්තු මස 19 වැනි දින.

ඉල්ලුම් පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත :-

රජයේ ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම සඳහා බෙදාදීමට ඇති ඉඩම් වෙනුවෙන් වාණිජ/කෘෂිකාර්මික/නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමට ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :————.
3. (i) ලිපිනය :————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :————.
      *(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* :————.
      *(ආ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
4. ගෘහ මූලික අංකය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :————.
7. උපන් දිනය :————.
8. විවාහක/අවිවාහක බව :————.
9. රැකියාව :————.

10. රැකියාව කරන ස්ථානයේ ලිපිනය :————.

11. අයදුම්කරු, කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම (රුපියල්) |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

12. ඉල්ලුම්කරු හා යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර ඃ

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් හවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |

(නිවාස හා දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය සඳහන් කරන්න :————.

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය ඃ තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග :————.

15. නිවස පිහිටි ස්ථානය :————.

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :————.

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසලේ/විදුහලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (vi) | | | |
| (v) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :————.

(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :————.

(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| (i)<br>(ii)<br>(iii) | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙළිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

—————,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :—————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.

අනු අත්සන් කරමි.

—————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :—————.
ලිපිනය :—————.

**දිවුරුම් ප්‍රකාශය**

.......................................... දිස්ත්‍රික්කයේ............................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ...................................... ග්‍රාම නිලධාරි වසමේ............................... පදිංචි............................................... වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ භාර්යාවට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන් ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම ඉහත කී අක්කර .................... රූඩ් .......................... පර්. ........................... ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

..............................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

—————,
සාමදාන විනිශ්චයකාර තැන.

04-204

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත් සභාව**

හෝමාගම (පිරිමි), වල්පිට (කාන්තා) දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයන්හි පැවැත්වෙන එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව - 2013/2014

ඉහත පාඨමාලාව සඳහා ශිෂ්‍ය - ශිෂ්‍යාවන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් කැඳවනු ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙනි. තව ද මෙම පාඨමාලාව ඉලක්ක කර ඇත්තේ කෘෂිකර්මය ව්‍යාපාරික මට්ටමින් ස්වයං රැකියා පදනමක් මත ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් වන්නන් සඳහා ය.

02. ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලෙස පවත්වනු ලබන මෙම පාඨමාලාව සාර්ථකව නිම කරන ශිෂ්‍ය- ශිෂ්‍යාවන් වෙත සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ. එහි අන්තර්ගත විෂයයන් පහත පරිදි ය :

(i) කෘෂිකර්ම ව්‍යවසායකත්වය හා වෘත්තීය මාර්ගෝපදේශනය,
(ii) කෘෂිකර්ම මූලධර්ම සහ සංවර්ධන ක්‍රියාවලිය,
(iii) කෘෂිකර්ම බෝග තාක්ෂණය,
(iv) සත්ත්ව නිෂ්පාදන කළමනාකරණය,
(v) කෘෂි ඉංජිනේරු ශිල්ප ක්‍රම,
(vi) ගෘහ ආර්ථික විද්‍යාව සහ ආහාර තාක්ෂණය.

ඉහත විෂයයන් ඔස්සේ පාඨමාලාව ඉදිරිපත් කිරීමේ දී නව කෘෂිකාර්මික තාක්ෂණික වර්ධනයට අදාළ නවතම සොයා ගැනීම් (*උදා.*: පසු අස්වනු තාක්ෂණය, පටක රෝපණ තාක්ෂණය, හරිතාගාර වගා ක්‍රම), ස්වයං රැකියා උපාය මාර්ග (*උදා.* :භූමි දර්ශ නිර්මාණය, විසිතුරු මත්ස්‍ය වගාව, ගොවිපළ ගිණුම්, ගොවිපළ උපකරණ නඩත්තුව හා ට්‍රැක්ටර් යන්ත්‍ර පැදවීම හුරු කිරීම) සහ තොරතුරු සැකසීමේ නව ක්‍රම සඳහා හුරුවක් ලබා දීමද (*උදා.* : පරිගණක භාවිතය) සිදු කරනු ඇත. එසේම, ග්‍රාමීය ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය සහ කාලීනව බලපවත්වන කෘෂිකාර්මික ප්‍රතිපත්ති පිළිබඳව අවබෝධයක් ද ලබා දෙනු ඇත.

03. *පාඨමාලාව පවත්වාගෙන යාම.*- වසරක කාලයකින් සමන්විත පාඨමාලාවේ අධ්‍යයන වාර තුනක් වේ. ප්‍රථම හා දෙවැනි වාර අවසානයේ දී සියලුම විෂයයන් සඳහා ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වේ. දෙවැනි වාරය තුළ අධ්‍යයන චාරිකා සැලසුම් කර ඇත. තුන්වැනි වාරය තුළ දී සෑම ශිෂ්‍ය - ශිෂ්‍යාවක්ම තමන් තෝරාගත් විෂය ක්ෂේත්‍රයන් මත බාහිර කෘෂිකාර්මික ව්‍යාපාරයක්/ආයතනයක් සමග සම්බන්ධ වී ව්‍යාපෘති අධ්‍යයනයක් සිදු කළ යුතු වේ. එම අධ්‍යයනය අවසානයේ දී තම ව්‍යාපෘතිය පිළිබඳව නිබන්ධනයක් සැකසීම සිදු කළ යුතු වේ. එම කාර්යය නිමාවත් සමග අවසාන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වනු ඇත. පාඨමාලාවට පැමිණීම 85% ක් සම්පූර්ණ කරමින් අඛණ්ඩ ඇගයීමක් තුළින් සමත් වන ශිෂ්‍ය - ශිෂ්‍යාවන් වෙත පාඨමාලාව අවසානයේ සහතික පිරිනමනු ලැබේ.

04. *බඳවා ගැනීමේ පරිපාටිය.*-

04.1 *අධ්‍යාපනික සුදුසුකම් :*

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල භාෂාව (භාෂාව හා සාහිත්‍ය), ගණිතය, විද්‍යාව, සමාජ අධ්‍යයනය හා තාක්ෂණික විෂය, (කෘෂිකර්මය, මැහුම් වැඩ, ගෙවතු වගාව, ගෘහ ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය හා ගිණුම්, මෝටර් කාර්මික ශිල්පය) ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම.

04.2 *වෙනත් සුදුසුකම් :*

(i) සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 17 ත් 25 ත් අතර විය යුතු ය.
(ii) අයදුම්කරුවන් අවිවාහක විය යුතු ය.
(iii) ප්‍රායෝගික කෘෂිකර්මයේ නියැලීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවිය යුතු ය.
(මෙය සනාථ කිරීමට රජයේ වෛද්‍ය නිලධාරියෙකු ගෙන් ලබා ගත් සහතිකයක් පාඨමාලාව ආරම්භයේ දී ඉදිරිපත් කළ යුතු ය.)
(iv) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලැබේ.
(v) කෘෂිකර්ම කටයුතුවල නිරත පුද්ගලයකු වීම හා එය වෘත්තියක් වශයෙන් ඉදිරියට ගෙන යාමට සූදානම් අයවලුන් වෙත විශේෂ අවධානය යොමු කෙරේ.
(vi) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වූ වර්ෂ තුනක කාලය තුළ අඩුම වශයෙන් වර්ෂ දෙකක්වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබූ බවට පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයකින් සනාථ කළ යුතු ය.

ඊට අතිරේකව,

අධ්‍යාපන හා අනෙකුත් අවශ්‍යතාවයන් සපුරාලන බස්නාහිර පළාතේ, පදිංචිකරුවෙකු නොවන අයෙකු පාඨමාලාව හැදෑරීමට කැමැත්තක් දක්වන්නේ නම්, ඔවුන්ට ද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසනු ලැබේ. එසේ වුවද අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී ඉහළම ප්‍රමුඛස්ථානය ලබා දෙන්නේ, බස්නාහිර පළාතේ පදිංචිකරුවන් සඳහා වේ. බස්නාහිර පළාතේ පදිංචි අයගෙන් ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන්නේ නම්, පිට පළාත්වල අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමට තීරණය කර ඇත.

05. *පාඨමාලාව සඳහා දිරි ගැන්වීමේ දීමනා :*

(i) පුහුණුව ලබන කාලය තුළ, පුහුණුවට පැමිණෙන දිනකට එක් අයෙකු සඳහා රුපියල් දෙසියපනහක (250) පුහුණු දිරි ගැන්වීමේ දීමනාවක් ගෙවනු ලබන අතර, එය ආහාර පාන සඳහා වැය කිරීමට සිදුවනු ඇත.
(ii) නේවාසිකාගාර පහසුකම් පුහුණුව ලබන කාලය තුළ දී සෑම සිසුවකුටම නොමිලේ සපයනු ලැබේ.

06. *පාඨමාලාවට සහභාගීවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය :*

(i) රුපියල් දෙසිය පනහක (250) ක තැන්පතුවක් තැබිය යුතු ය.
(ii) පුහුණුවෙන් පසු කෘෂිකර්මාන්තයේ නියැලීම පිණිස අවශ්‍ය මූලික පහසුකම් සුළු ප්‍රමාණයක් හෝ තිබිය යුතු ය.
(iii) පුහුණුවෙන් පසු රජයේ රැකියාවක් සැපයීමට බස්නාහිර පළාත් සභාව හෝ මධ්‍යම රජය බැඳී නොමැති බව විශේෂයෙන් අවධාරණය කෙරේ.
(iv) පුහුණුව ලබන කාලය තුළ දී පුහුණු ආයතන විසින් පවත්වනු ලබන පොදු නීති-රීතිවලට එකඟ වන බවට ලිඛිතව ප්‍රකාශ කළ යුතු ය.
(v) පුහුණු කාල සීමාව තුළ විනය විරෝධී සහ නීති-රීතිවලට පටහැනිව කටයුතු කරන්නන්ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට බලධාරීන් විසින් කටයුතු කරනු ලැබේ.

07. මෙහි පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත් අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් 2013 ජුනි 30 වැනි දිනට හෝ එදිනට පෙර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර), පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, අංක 154, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07, ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "2013/2014 වසර සඳහා එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව සඳහා අයදුම්පත" යනුවෙන් ලියා එවිය යුතු ය.

(i) බඳවා ගැනීම සම්බන්ධව අවසාන තීරණය බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ සතු ය.
(ii) අසම්පූර්ණ හෝ අවිධිමත් ඉල්ලුම් පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ තෝරා ගත් සීමිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණි.
(iii) දැනට පාසල් හැර ගොස් ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට පමණක් සැලකිල්ලක් දක්වන බැවින් සම්මුඛ පරීක්ෂණයේ දී පාසල් හැරයාමේ සහතිකය අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතු ය.
(iv) තමා අධ්‍යාපනය ලැබූ විදුහලෙන් සහ ප්‍රදේශයේ ප්‍රභුවරයෙකුගෙන් මෑතක දී ලබා ගත් චරිත සහතිකවල පිටපත් දෙකක්, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සඳහා සහතික වල පිටපත් අයදුම් පත්‍රයට යා කර එවිය යුතු ය.
(v) ජාතික හැඳුනුම්පත සමඟ අධ්‍යාපන හා වෙනත් සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී පමණක් ඉදිරිපත් කළ යුතු ය.

ආර්. පී. මහින්දපාල,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(බස්නාහිර).

පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (බස්නාහිර),
අංක 154, නන්දදාස කෝදාගොඩ මාවත,
කොළඹ 07.

**හෝමාගම (පිරිමි), වල්පිට (කාන්තා) දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානවල එක් අවුරුදු වෘත්තීය කෘෂිකර්ම පුහුණු පාඨමාලාව 2013/2014 සඳහා ශිෂ්‍ය - ශිෂ්‍යාවන් බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය**

1. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
2. මුලකුරු සමග නම :————.

3. (i) ස්ථිර ලිපිනය :————.
(ii) පදිංචි දිස්ත්‍රික්කය :————.

4. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
5. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

6. (i) හැඳුනුම්පත් අංකය :————.
(ii) හැඳුනුම්පත නිකුත් කළ ආයතනය හා දිනය :————.

7. පියාගේ හෝ භාරකරුගේ නම :————.
8. පියාගේ හෝ භාරකරුගේ ලිපිනය :————.
9. අධ්‍යාපන සුදුසුකම් :————.

*(අ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය (.............................. වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* | *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

*(ආ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය (.............................. වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* | *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

*(ඇ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය. (..............................වර්ෂය)

| *සමත් විෂයයන්* | *ලැබූ සාමාර්ථයන්* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

10. *වෙනත් බාහිර සුදුසුකම් හා බාහිර ක්‍රියාකාරකම්.-*

(i) ————.
(ii) ————.
(iii) ————.

11. ඔබ උසස් අධ්‍යාපන ආයතනයක හෝ කාර්මික විද්‍යාලයක/ආයතනයක පාඨමාලාවක් සඳහා තේරී පත්වී සිටීද? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. කිසියම් තොරතුරක් අසත්‍ය යැයි මා තෝරා ගැනීමෙන් පසු එළිදරව් වුවහොත් කිසිම පරීක්ෂණයකින් තොරව මාගේ ආධුනිකභාවය අවලංගු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

04-163

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිළදී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාමෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| අප්‍රේල් | 2013.04.05 | සිකුරාදා | 2013.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.04.12 | සිකුරාදා | 2013.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.04.19 | සිකුරාදා | 2013.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.04.26 | සිකුරාදා | 2013.04.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2013.05.03 | සිකුරාදා | 2013.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.10 | සිකුරාදා | 2013.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.17 | සිකුරාදා | 2013.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.23 | බ්‍රහස්පතින්දා | 2013.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.05.31 | සිකුරාදා | 2013.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2013.06.07 | සිකුරාදා | 2013.05.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.06.14 | සිකුරාදා | 2013.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.21 | සිකුරාදා | 2013.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.06.28 | සිකුරාදා | 2013.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.